# අභ්‍යන්තර සංදේශය

පාලන අංශය

| | | |
|---|---|---|
| වෙත | : | සියලුම ආයතන/අංශ ප්‍රධානීන් |
| වෙතින් | : | අතිරේක ලේකම්(පාලන) |
| විෂය | : | “2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත” සම්බන්ධයෙන් වන පුහුණු වැඩසටහන |
| ප්‍රමුඛත්වය | : | ඉතා වැදගත් |
| දිනය | : | 2026.06.12 |
| යොමු අංකය | : | MWCA/02/05/21/30/10/14(2026) |

01. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 7,8 සහ 9 වගන්ති ප්‍රකාරව එක් එක් වර්ෂයේ ජූනි මස 30 වන දිනට සහ දෙසැම්බර් 31 වන දිනට ප්‍රථම තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 3 වන වගන්තිය යටතේ පුරවැසියෙකුට ප්‍රදානය කර ඇති තොරතුරුවලට ප්‍රවේශ වීමට ඇති අයිතිවාසිකම ක්‍රියාත්මක කිරීමට හැකිවනු පිණිස අමාත්‍යවරයා හට වාර්තාවක් පිළියෙල කිරීම සඳහා අමාත්‍යාංශයේ සියලුම අංශ අනුබද්ධ ආයතන සහ දෙපාර්තමේන්තු විසින් සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතු නව ආකෘති පත්‍ර පිළිබඳ නිලධාරීන් දැනුවත් කිරීමේ විශේෂ වැඩසටහනක් ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ මානව සම්පත් සහ පුහුණු අංශය මගින් සංවිධානය කර ඇත.

02. මෙම පුහුණු වැඩසටහන, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ හිටපු කොමසාරිස් නීතිඥ ජගත් ලියනාරච්චි මහතාගේ සම්පත් දායකත්වයෙන් ජූනි මස 19 වන සිකුරාදා දින පෙ.ව. 9.00 සිට ප.ව. 12.00 දක්වා සෙත්සිරිපාය - අදියර II, හතරවන මහලේ පිහිටි ශ්‍රවණාගාරයේ දී පැවැත්වීමට සැළසුම් කර ඇත.

03. ඒ අනුව, **මෙම වැඩසටහනට සියළුම අංශ/දෙපාර්තමේන්තු ප්‍රධානීන්, තොරතුරු නිලධාරීන් සහ එම විෂය නිලධාරීන් සහභාගී වීම අනිවාර්ය** වන අතර ඔවුන්ගේ තොරතුරු **අමුණා ඇති ආකෘති පත්‍රය අනුව සම්පූර්ණ කර ඔබගේ නිර්දේශය ද සහිතව 2026.06.15 දින** වන විට මා වෙත යොමු කරන ලෙස කාරුණිකව දැනුම් දෙන අතර **එහි නම් සඳහන් යම් නිලධාරියෙකු අත්‍යාවශ්‍ය හේතුවක් මත මෙම පුහුණුව සඳහා සහභාගී නොවන්නේ නම් පුහුණු දිනයට පෙර මා වෙත ලිඛිතව දැනුම් දීමට** කටයුතු කළ යුතු බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

**එම්.එච්.පී.බණ්ඩාර**
අතිරේක ලේකම්(පාලන)
ලේකම් වෙනුවට

CamScanner

(ඇමුණුම 01)

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර | අත්සන |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

CamScanner